විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. | மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. | Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2011   දිනය / திகதி / Date 2011- 11- 01

**චක්‍රලේඛ ලිපි 03**

සියලුම මහ නගර සභා - නගරාධිපතිවරුන්/ නාගරික කොමසාරිස්වරුන්,
නගර සභා - නගරාධිපතිවරුන්/ නාගරික ලේකම්වරුන්,
ප්‍රාදේශීය සභා - ප්‍රාදේශීය සභා සභාපතිවරුන්/ ලේකම්වරුන්.

## <u>පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප්/ වැන්දඹු අනත්දරු හිමිකම් ප්‍රදානය කිරීම</u>

මවිසින් නිකුත් කරන ලද 2011- 02- 24 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/ 2011 හා 02/ 2011 [ සංශෝධන I හා II ] කෙරේ ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

(1). 1993- 09- 03 දිනට පෙර විශ්‍රාම ලැබූ පළාත් පාලන නිලධාරීන්ගේ සේවක අර්ථසාධක අරමුදල් සහිත සේවා කාලය විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් වශයෙන් සැලකීමට පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

I. පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කොට ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ප්‍රදානය කර තිබිය යුතුය.

II. ආයතනයේ දායකත්වය මෙම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු අතර, සේවක දායකත්වයෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් අයකොට මෙම දෙපාර්තමේන්තුවට එවිය යුතුය.

(2). 1993- 09- 03 දින සිට පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලැබූ නිලධාරීන්ගේ සේවක අර්ථසාධක අරමුදල් සහිත සේවා කාලය විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් වශයෙන් සැලකීමට පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

I. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ප්‍රදානය කර තිබිය යුතුය.

II. ආයතනයේ දායකත්වය මෙම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු අතර, සේවක දායකත්වයෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් අයකොට මෙම දෙපාර්තමේන්තුවට එවිය යුතුය.


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone | |
|---|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 | |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 | |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 | E-mail: pensions@sltnet.lk |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 | Web site: www.pensions.gov.lk |

(3) වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් අයකිරීමේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 3/ 2008 ප්‍රකාරව ක්‍රියාකළ යුතුය.

(4) 2011 නොවැම්බර් මස 01 වන දින සිට ප්‍රදානය කරන ලද සේවක අර්ථ සාධක අරමුදල් සහිත සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු නොලබන අතර, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් සහිත සේවා කාලය පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

ඉහත අංක 1 සහ 2 හි සුදුසුකම් සපුරන සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් සේවා කාලය විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් සේ සැලකීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතු බව කාරුණිකව දන්වමි. (අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි ඇමුණුම් I හි දක්වා ඇත).

කේ.ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**ඇමුණුම් 1**

**සේවක අර්ථ සාධක අරමුදල් සහිත සේවා කාලය විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් වශයෙන් සැලකීම සඳහා අනුමැතිය ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතු ලියවිලි**

- ❖ සේවක අර්ථ සාධක අරමුදල් සහිත පත්වීම් ලිපිය
- ❖ පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය (1993- 09- 03 දිනට පෙර පත්වීම් ලාභීන් සඳහා පමණි)
- ❖ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලිපිය
- ❖ ආයතනයේ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය මෙම දෙපාර්තමේන්තුවට ගෙවූ බවට ලිඛිත සාක්ෂි. (ලදුපතේ පිටපත)
- ❖ සේවක දායකත්වයෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් අයකර වැන්දඹු අනත්දරු අරමුදල වෙත ප්‍රේෂණය කළ බවට ලිඛිත සාක්ෂි. (දායක මුදල් ලේඛණයේ පිටපත)